1 සතර කන් මන්ත්‍රණය

(කුරුණෑගල අවධිය)

පන්සිය පනස් ජාතක පොත 14 වන සියවසෙහි කුරුණෑගල රජ කළ සතර වන පණ්ඩිත පරාක්‍රමබාහු රජ දවස වීරසිංහ ප්‍රතිරාජ නමැති ඇමැතිවරයාගේ අනුග්‍රහයෙන් සිංහලයට නගා ඇති බව කියැවේ. මේ සඳහා මූලාශ්‍රය කොට ගත් ග්‍රන්ථය වන්නේ ජාතකට්ඨ කථාවයි.

සිංහල පන්සිය පනස් ජාතක පොත මුල් කෘතියෙහි ඍජු පරිවර්තනයක් නො වේ. ජාතක ගාථා ස්වල්පයක් දක්නට ලැබීමත්, වෛයාකරණ (ගාථාවල අදහස් හා වචන විස්තර) කොටස දක්නට නොලැබීමත්, අතීත කතාව අඛණ්ඩ ව ඉදිරිපත් කිරීමත් සිංහල ජාතක කතා පොතෙහි ලක්ෂණ වේ. 'පන්සිය පනස් ජාතක කතා පොත' ලෙස හැඳින්වූව ද එහි සැබවින් ම ඇත්තේ ජාතක කතා 547කි.

සිංහල ජාතක කතාවන්ට නියමිත ආකෘතියක් දක්නට ඇත. ඒ අනුව,

වර්තමාන කතාව,
අතීත කතාව,
සමෝධානය

යන ලක්ෂණ, සිංහල ජාතක කතාව තුළ දක්නට ලැබෙන අංග යි.

ජාතක පොත ඇසුරු කර ගෙන රචිත පරිවාර ග්‍රන්ථ රාශියක් ද වේ. ජාතක පොත සිංහලයට නැගුණු පසු ව ද වෙන් වෙන් වශයෙන් ජාතක කතා ලියවී ඇත. **උම්මග්ග ජාතකය, එළු උමංදාව, උම්මදන්ති ජාතකය** එබඳු ග්‍රන්ථ කීපයකි. **මුවදෙව්දාවත, සසදාවත** හා **කව්සිළුමිණ** ජාතක කතා ඇසුරෙන් රචිත ගී කාව්‍යයි. **කාව්‍යශේඛරය, ගුත්තිල කාව්‍යය, සඳ කිඳුරු දා කව, කුස ජාතක කාව්‍යය, දහම් සොඬ දා කව, වෙස්සන්තර ජාතකය, මුව ජාතකය, නිමි ජාතකය, කව්මිණි කොඬොල, කව්මිණි මල් දම** ආදිය ද ජාතක පොත ඇසුරෙන් බිහි වූ කාව්‍ය ග්‍රන්ථයි.

උම්මග්ග ජාතකය රචනා කිරීමේ අරමුණ වී ඇත්තේ මහෞෂධ පඬිතුමාගේ බුද්ධි මහිමය ප්‍රකාශ කිරීමයි. ජාතක කතා අතර දීර්ඝතම කතාව වන මෙහි මහෞෂධ පඬිතුමා කුඩා අවධියේ සිට සිය නුවණ මෙහෙයවා කටයුතු කරන ආකාරයත් රජුට සේවය කිරීමේ දී සතුරු කුමන්ත්‍රණ පරදා රාජ්‍යය හා ජීවිත බේරා ගැනීමට උපායශීලී ව කටයුතු කරන ආකාරයත් විස්තර කෙරේ. එම ජයග්‍රහණය ලබන්නේ කිසිදු ජීවිත හානියක් සිදු නොවන ආකාරයට වීම මෙහි විශේෂත්වයකි. උම්මග්ග ජාතකයේ එන සතර කන් මන්ත්‍රණයේ සිට ධර්ම යුද්ධය දක්වා මෙම පාඩමට ඇතුළත් වේ.

එ සමයෙහි උත්තර පඤ්චාල නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කෙරෙති. ඒ රජ්ජුරුවනට කේවට්ට නම් බමුණු කෙනෙක් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නාහ. උඟ තුමූ නුවණැත්තාහ; වියත්තාහ. ඒ කේවට්ටාචාරි එක් දවසක් තුමූ අලුයම් වේලෙහි පිබිද, සුවඳ තෙලෙහි නඟන ලද පහන් ආලෝකයෙන් ගන්ධදාම පුෂ්පදාමාවලම්බිත නා නා වර්ණ විචිත්‍ර විතානෝපලක්ෂිත අලංකෘත ශ්‍රී යහන් ගර්භය බලන්නාහු මහත් වූ සම්පත් දැක, 'මේ මාගේ යසස කවුරුන් සන්තක දෝ හෝ' යි සිතන්නාහු 'අනෙක් කෙනෙකුන් සන්තක නො වෙයි; චූලනී බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන් සන්තක ය. මෙ බඳු සම්පත් දුන් රජ්ජුරුවන් සියලු දඹදිවට අග රජ කළොත් යහපත. එ සේ වුව හොත් මමත් අග්‍ර පුරෝහිත වෙමි' යි සිතා, උදෑසනක් සේ ම රජ්ජුරුවන් සමීපයට ගොස් රෑ දවස සුවයෙන් නිදි ලත් පරිදි විචාරා, "දේවයන් වහන්ස, කොට-පිය යුතු කථාවෙක් ඇත" යි කීහ. රජ්ජුරුවෝ, "කියව, ආචාරීනි" යි කීහ. "දේවයන් වහන්ස, ඇතුළු නුවර දී රහස් කියන්නට නොපිළිවන. මඟුල් උයනට යම්හ" යි කීහ. රජ්ජුරුවෝ "යහපත ආචාරීනි" යි කියා බමුණන් හා සමග උයනට ගොස්, සේනාව පිටත සිටුවා වට කොට රකවල් ලවා බමුණන් හා සමග ඇතුළු උයනට වැද මඟුල් සල් වටෙහි හුන්හ.

ගිරා පණ්ඩිතයෝ මේ ක්‍රියාව දැක, 'මේ එක් කාරණයක් වුව මැනැව. අද පණ්ඩිතයන් වහන්සේට කිය යුතු කිසිවක් අසමි' යි උයනට වැද, මඟුල් සල් ගස කොළ අතර සැඟවී හුන්හ. රජ්ජුරුවෝ බමුණාණන්ට, "කිය යුතු රහස් කියව, ආචාරීනි" යි කීහ. "දේවයන් වහන්ස, නුඹ වහන්සේගේ කන මැතට නමා ලුව මැනැව. මේ මන්ත්‍රණය සතර කන් මන්ත්‍රණය නම් වන්නේ ය. ඒ හෙයින් නුඹ වහන්සේගේ දෙ කන හා මගේ දෙ කන මුත් අනෙක් කනකට නොයා යුතු වන්නේ ය. ඉදින් දේවයන් වහන්ස, මා කීවා කරන සේක් නම් සියලු දඹදිවට නුඹ වහන්සේ අග රජ කොට ලමි" යි කීහ. චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ද මහත් වූ රාජ්‍ය ලෝභයෙන් යුක්ත බැවින් බමුණන්ගේ බස් අසා සතුටු වැ "කියව ආචාරීනි, තොප කීවාක් කෙරෙමී" යි කීහ.

"දේවයන් වහන්ස, අපි සේනාව රැස් කොට ගෙන පළමු කොට කුඩා නුවරක් වට කොට ගනුම්හ. මම කුරුබිලියෙන් ඇතුළු නුවරට වැද, ඒ නුවර රජ්ජුරුවනට, 'දේවයනි, තොප හා අප හා සටන් කොට කාරියෙක් නැති; හුදෙක් අප නතු වව. තොපගේ රාජ්‍යය තොපට ම වන්නේ ය; සටන් කොළො නම් අපගේ සේනා වාහන මහත් හෙයින් ඒකාන්තයෙන් ම පරදුව' යි කියමි. ඉදින් මා කී ලෙස නොකොළෝ නම්, සටන් කොට අල්ලා ගෙන මරා පියා උන්ගේ සේනාවත් හැර ගෙන අනෙක් නුවරකට යම්හ. ඒ නුවරත් එසේ ම යටත් කොට ගෙන, ඉන් අනෙක් නුවරෙකැ යි මේ සැටියේ ම සියලු දඹදිව රාජ්‍යය ගෙන 'ජය පානය අනුභව කරම්හ' යි කියා එක් සියයක් රජදරුවන් අපගේ නුවරට ගෙන'වුත් උයනැ දී රා මණ්ඩලයක් සාදා උන් හැම දෙනා 'රා බොන්නට යැ' යි රා මැඩිල්ලේ හිඳුවාලා විෂ යොදා කරන ලද්දා වූ රා අනුභව කරවා උන් හැම දෙනා ම ජීවිත විනාශයට පමුණුවා ගඟ දියට දමා එක් සියයක් රාජධානියෙහි රාජ්‍යය අත් පත් කොට ගනුම්හ. එ සේ කල්හි නුඹ වහන්සේ සියලු දඹදිවට අග රජ වන සේකැ" යි කීහ. රජ්ජුරුවෝ "යහපත ආචාරීනි, තොප කී ලෙස ම කෙරෙමී" කීහ. "දේවයන් වහන්ස, මේ මන්ත්‍රණය සතර කන් මන්ත්‍රණය නම් වෙයි; අනෙක් කෙනකුන් දත නොහැක්කේ ය. එසේ හෙයින් කල් නොයවා යහපත්

නැකැතෙකින් වහා නික්මුණු මැනැවැ" යි කීහ. රජ්ජුරුවෝ "යහපතැ" යි ගිවිස්සාහ. ගිරා පෝතකයෝ ඒ මන්ත්‍රණය අසා නිමවා, උන් දෙදෙනා මන්ත්‍රණය කොට අන්තයෙහි දී, සාල්ලෙක ලාලා පාතට බාන කෙනකුන් මෙන් කේවට්ට බමුණා හිසැ වර්චස් පිඬක් හෙළා, 'කිමෙක් ද' යි කට දල්වා ගෙන උඩ බැලූ තැනැත්තවුන්ගේ මුඛයේ නැවැත වර්චස් පිඬක් හෙළා, "ක්‍රීන්" යන අනුකරණයෙන් හඬමින් කොළ'ත්තෙන් උඩ නැඟී, "කේවට්ටය, තෝ තමාගේ මන්ත්‍රණය සතර කන් මන්ත්‍රණ යැ යි සිතයි ද? දැන් ම සකන් වැ ගියේ ය. නැවැත අට කනකට ගොස්, පසු ව නොයෙක් සිය කනකට යන්නේ යැ" යි කීහ. ගිරවා "කොල, ගනුව" යි කියද්දී ම පවනට බඳු වූ වේගයෙන් පියාසර කොට මියුලු නුවරට ගොස් මහෞෂධ පණ්ඩිතයන් වහන්සේගේ ප්‍රාසාදයට වන්හ.

ඒ ගිරා පණ්ඩිතයන්ගේ මෙ බඳු වතෙක් ඇත්තේ ය. ඉදින් කිසි තෙනෙකින් ගෙනා හස්නක් පණ්ඩිතයන් වහන්සේට පමණක් කිය යුතු වී නම් උන් වහන්සේගේ දසරුවට බස්නාහ; ඉදින් අමරා දේවීනුත් ඇසුව මනා වී නම් ඇකයෙහි ගොස් හිඳිනාහ; ඉදින් බොහෝ දෙනා ඇසුව මනා වී නම් බිමට බස්නාහ. එදවස් ගිරා පණ්ඩිතයෝ පණ්ඩිතයන් වහන්සේගේ දසරුවෙහි බැස උන්හ. ඒ සලකුණෙන්, 'රහසැ බිණිය යුතු යැ' යි අමරා දේවීන් හා බොහෝ දෙන ඉවත් ව ගියහ. පණ්ඩිතයන් වහන්සේ සුව පෝතකයන් හැර ගෙන මතු මාල් තලයට නැඟී, 'සබඳ, තොප විසින් කුමක් දක්නා ලද ද; කුමක් අසන ලද ද' යි විචාළ සේක. ඉක්බිති ගිරා පණ්ඩිතයෝ බෝධිසත්ත්වයන් වහන්සේට, "මම, දේවයෙනි, සියලු දඹදිව අනෙක් රජ්ජුරු කෙනකුන් සමීපයෙන් කිසි භයක් නො දිටිමි. උත්තර පංචාල නුවර චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ කේවට්ට නම් පුරෝහිතයාණෝ රජ්ජුරුවන් උයනට ගෙන ගොස්, සතර කන් මන්ත්‍රණයක් කළහ. මම මඟුල් සල් ගසැ අත්තක් ඇතුළේ සැඟැවී හිඳ, මන්ත්‍රණය අසා නිමවා ගෙන කේවට්ට බමුණා කටැ වර්චස් පිඬක් හෙළා පියා ආමී" යි කියා සියලු තමන් දුටු දෙයත් ඇසූ දෙයත් පණ්ඩිතයනට දැන්වූහ. උන් වහන්සේ විසින් "රජ්ජුරුවෝ ගිවිස්සෝ ද" යි විචාළ කල්හි, "ගිවිස්නා ලද යැ, දේවයෙනි" යි කීහ. පණ්ඩිතයන් වහන්සේ ගිරා පෝතකයනට කළ මනා සත්කාර කොට හෙවත් මීයෙන් හැනූ විලඳ කවා, මී පැන් පොවා, බේත් තෙලින් පියා සඟළ මැඩ, මොළොක් ඇතිරිලි අතුරන ලද රන් මැදිරියෙහි සතප්පා, කේවට්ටයා මා මහෞෂධ පණ්ඩිත බව නො දනිතී යි සිතමි. දැන් ඔහු කළ මන්ත්‍රණය මුදුන් පැමිණ නො දෙමි යි සිතා, ඇතුළු නුවර හුන් දිළිඳුන් පිටත් කරවා පිටි නුවර ලැවූ සේක. පිටි රටින් දනවුවලින් සතර වාසල නියම් ගම් සතරින් වස්ත්‍රාභරණ ධනධාන්‍යාදීන් සමෘද්ධ වූ ඉසුරුමතුන් ගෙන්වා ඇතුළු නුවර වැස්වූ සේක; බොහෝ ධනධාන්‍ය රැස් කරවූ සේක.

චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ද කේවට්ටයන්ගේ බස් ගෙන, හස්ත්‍යශ්වාදි සෙනඟ පිරිවරා ගොස් එක් කුඩා නුවරක් වටලා ගත්හ. කේවට්ට බමුණු තමා යට කී සැටියේ ම කුරුබිලියෙන් ඇතුළු නුවරට වැද කාරණාකාරණ ඒ රජ්ජුරුවනට කියා තමන් වසඟ කොටගෙන, දෙ සේනාව එක් කොටගෙන අනෙක් නුවරෙක රජ්ජුරුවනැයි මෙ සේ චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ කේවට්ටාචාරීන්ගේ අවවාදයෙහි සිට ඒ වෛදේහ රජ්ජුරුවන් තබා සෙසු සියලු දඹදිව රජ දරුවන් තමන් නතු කළහ. බෝධිසත්ත්වයන් වහන්සේ විසින් ඒ ඒ රජ්ජුරුවන් සමීපයෙහි සිටුවන ලද පුරුෂයෝ ද, "බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් විසින් අද වකට මෙතෙක් නුවර ගන්නා ලද, පණ්ඩිතයන් වහන්ස, නොපමා වන සේක්ව" යි කියා නිරන්තරයෙන් හසුන් එවන්නාහ. උන් වහන්සේ ද ඒ යෝධයනට, "මම මෙහි පමාවක් නැත්තෙමි. තෙපි

උකටලී නො වැ නොපමා වැ වසව" යි කියා යවන සේක.
බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ සත් හවුරුදු සත් මස් සත් දවසෙකින් වේදේහ රජ්ජුරුවන්ගේ රාජ්‍යය තබා සෙසු දඹදිව රාජ්‍යයන් ගෙන කේවට්ට බමුණානට, "ආචාරීනි, මියුලු නුවර වේදේහ රජ්ජුරුවන්ගේ රාජ්‍යය ගනුම්හ" යි කීහ. "දේවයන් වහන්ස, මහෞෂධ පණ්ඩිතයන් වසන නුවර රාජ්‍යය ගන්නට නොපොහොසතුම්හ. ඒ පණ්ඩිතයෝ වනාහි මෙ බඳු නුවණැත්තාහ. ඉතා ම උපායවන්තයහ" යි, මෙ සේ ඒ කේවට්ට බමුණු ආචාරි විස්තර කොට, සඳ මඬලෙහි අඳනා කෙනකුන් මෙන් මහ බෝසතාණන් වහන්සේගේ ගුණ රජ්ජුරුවනට කීහ. ඒ ආචාරි තුමූත් උපායවත්හු ම ය. එසේ හෙයින් "මියුලු නුවර රාජ්‍යය නම් ඉතා ස්වල්ප ය. සියලු දඹදිව රාජ්‍යය අපට සෑහෙයි. එක් රාජ්‍යයකින් අපට කාරිය කිම් දැ?" යි උපායෙන් රජ්ජුරුවන් ගිවිස්සූහ. සෙසු රජ දරුවෝ "අපි මියුලු නුවර රාජ්‍යය ගෙන ම ජන පානය බොම්හ" යි කියන්නා, කේවට්ට ආචාරි උනුන් කාරණ කියා වළකා, "වේදේහ රාජ්‍යය ගෙන කුමක් කරමෝ ද? ඒ රජ්ජුරුවෝත් අප නතුවෝ ම ය. නවතුව" යි එක් සියයක් රජ දරුවන් උපායෙන් ගිවිස්සූහ. ඒ රජ්ජුරුවෝ කේවට්ට නම් බමුණාන්ගේ බස් අසා මියුලු නුවරට යන ගමන් නැවැත්තාහ. බෝසතාණන් වහන්සේට ඔබ වහන්සේගේ චර පුරුෂයෝ, "බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එක් සියයක් රජ දරුවන් පිරිවරා මියුලු නුවරට නික්මුණාහු නැවත තමන්ගේ නුවරට ම නැඟී ගියහ" යි හසුන් එවූහ. බෝධිසත්ත්වයන් වහන්සේ ද ඒ පුරුෂයනට "මෙ තැන් පටන් කොට රජ්ජුරුවන් කරන ක්‍රියාවන් දැන එවන්නේ යැ" යි කියා නැවත හසුන් යැවූ සේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ද කේවට්ටයන් හා සමග "විෂ මිශ්‍ර සුරා පානය අනුභව කරවා රජ දරුවන් මැරීම් සංඛ්‍යාත ඒ කටයුත්ත දැන් කරම්හ" යි මන්ත්‍රණය කොට, "අපි ජය පානය බොම්හ" යි කියා, "මඟුල් උයන නඳුන් උයනක් සේ සරසා දහස් ගණන් කුඩාරම්වල රා පුරා තබ්බා අනේක ප්‍රකාර මසවුළු ඒ ඒ ස්ථානයෙහි වළන් පුරා රැස් කොට තබව"යි අමාත්‍යයන්ට විධාන කළහ. එ පවත් පණ්ඩිතයන් වහන්සේට අන්තස්සර පුරුෂයෝ කියා යැවූහ. ඔහු වනාහි විෂ යොදා රජ්ජුරුවන් මරනු කැමැති නියාව නො දනිති; මහ බෝසතාණන් වහන්සේ වනාහි ගිරා පෝතකයන් අතින් ඇසූ බැවින් දන්නා සේක. එ සේ හෙයින් උන් වහන්සේගේ අන්තස්සරයන්ට "ජය පානය බොන දවස් නියම කොට කියා එවවු" යැ යි නැවත හසුන් යැවූ සේක. ඒ යෝධයෝ වදාළ ලෙස ම දවස් නියම කොට යැවූහ.

ඒ අසා පණ්ඩිතයන් වහන්සේ 'මා බඳු පණ්ඩිත කෙනකුන් ජීවත් වැ හින්ද දී ම මෙතෙක් රජ දරුවන් මිය යාම යුක්ත නොවන්නේ ය. උනට මා පිටුවහල් වුව මැන වැ' යි සිතා, තමන් වහන්සේ හා එක දවසැ උපන් යෝධයන් දහස බණවා "සබඳිනි, චූලනි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ උයන සරහවා එක් සියයක් රජ දරුවන් පිරිවරා සුරා පානය අනුභව කරනු කැමැත්තෝ ය. තෙපි ඔබ ගොස් රජ්ජුරුවන්ට අසුන් පනවාලූ කල කිසි කෙනකුන් නොහිඳිනා තුරු ම චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හිඳිනට පැනැවූ අස්නට ඉක්බිති පැනැවූ මා ඇඟි අස්නක්, 'අපගේ රජ්ජුරුවන්ට යැ' යි ගෙන, ඒ රජ දරුවන්ගේ සේනාව විසින්, 'තෙපි කවුරුන්ගේ සේනා දැ?' යි කී කල 'වේදේහ රජ්ජුරුවන්ගේ සේනා වම්හ' ය කියව. 'කිමෙක් ද? අපි සත් හවුරුදු සත් මස් සත් දවසක මුළුල්ලෙහි දඹදිව රාජ්‍ය ගන්නමෝ, එක දවසකුත් වේදේහ රජ්ජුරු කෙනකුන් නුදුටුම්හ. වේදේහ රජ්ජුරුවෝ නම් කවරහු ද? යව, උනට වුවමනා වී නම් කෙළවර අස්නක් ගනුව' යි තොප හා සමඟ කලහ කරන්නාහ. තෙපි 'බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් විනා අපගේ රජ්ජුරුවන්ට වැඩි තරම් කෙනෙක් නැතැ' යි

කලහ වඩා ගෙන, 'අපගේ රජ්ජුරුවනට අස්න පමණකුත් නොලබන්නමෝ, දැන් තොප රාත් පිය නො දෙම්හ' යි 'මස් අවුළු ආදියත් කෑ නො දෙම්හ' යි වාසි බෙණෙමින් සිංහ නාද ඇසූ මුව පොල්ලන් පරිද්දෙන් තොපගේ අභීත ශබ්දයෙන් ම උන් භය ගන්වා යමුගුරු බා ලා සියලු රා මස් පිරූ සැළවල් බිඳ තු තු කොට පියා වහා රා මස් අවුළු විසුරුවා නො කෑ හැකි පරිද්දෙන් කොට දිවීමෙන් ගොස් සේනා මධ්‍යයට වැද, ශක්‍ර පුරයට වන් අසුර භටයන් පරිද්දෙන් මහත් අරගල කොට, 'අපි මියුලු නුවර මහෞෂධ පණ්ඩිතයන්ගේ යෝධයම්හ. පිළිවන් වී නම් අප අල්ලා ගනුව' යි තොප ගිය බව හඟවා එව" යි කියා යෝධයන් දහස යැවූ සේක.

ඒ යෝධයෝත් බෝධිසත්ත්වයන් වහන්සේ වදාළ බස් මුදුනින් පිළිගෙන වැඳ සමු ගෙන දුනු, මුගුරු, අඩයටි, පත්කොහොල්, පාරාවළලු යෑ යන පඤ්චායුධ සන්නද්ධ වැ උතුරු පසල් දනවුවැ නුවරට ගොස් නඳුන් උයන මෙන් සරහන ලද උයනට වැද, නඟන ලද දළ පුඩු සේසත් ඇති එක් සියයක් රාජාසන ආදි වූ පිළියෙල කොට තබන ලද ශ්‍රී විභූතීන් දැක, මහ බෝසතාණන් වහන්සේ විසින් වදරන ලද ක්‍රමයෙන් ම සියල්ල කොට සේනා මධ්‍යයට වැද බොහෝ දෙන ක්ෂෝභ කොට තමන්ගේ මියුලු නුවරට පලා ගියහ.

මියුලු නුවර වටලෑම

චූලනී රජ ද 'එක් සියයක් රජ දරුවන් මරන පිණිස ශෘංගි ලා ඉදි කරන ලද මෙබඳු සුරා පානය මහෞෂධ පණ්ඩිතයන් විසින් බාධා කෙළේ යැ' යි කිපියේ ය. එක් සියයක් රජ දරුවෝ ද, 'අපට ජය පානය බී ගත නුදුන්හ' යි කිපියෝ ය. සේනාව ද, 'අපි නොමිලයේ බොන සුරා පානය නොලද්දම්හ' යි කිපියහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ද එක් සියයක් රජ දරුවන් බණවා, "එව, පින්වත්නි, මියුලු නුවර ගොස් වේදේහ රජ්ජුරුවන්ගේ ඉස තල්පැන් පලක් මඬනා සේ කඩුවෙන් කපා පියා දෙ පයින් මැඩ ගෙන හිඳ ජය පානය බොම්හ. සේනාව ගමනට සැරසී ගෙන එන පරිද්දෙන් විධානය කරව" යි කියා නැවත රහසිගත වැ කේවට්ටයනට ද ඒ පවත් කියා, "අපගේ මෙබඳු මන්ත්‍රණයට බාධා කළා වූ පසමිතුරා ගනුම්හ; එක් සියයක් රජ දරුවන් හා අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාව හා පිරිවරා ඒ මියුලු නුවරට යම්හ. අප හා කැටි ව එව, ආචාරීනි" යි කී හ. බමුණාණෝ තමන් නුවණැති හෙයින් 'මහෞෂධ පණ්ඩිතයන් දෑ ගන්නට නොපිළිවන. ගියොත් අපට මහත් ලජ්ජා වන්නීය. කාරණ කියා රජ්ජුරුවන් නවතමි' යි සිතා, රජ්ජුරුවන්ට "දේවයෙනි, මේ වේදේහ රජහුගේ බලයෙක් නො වෙයි, මහෞෂධ පණ්ඩිතයන්ගේ විධාන යැ. උෟ තුමූ මහානුභාව ඇත්තාහ. ඒ මහෞෂධ පණ්ඩිතයන් විසින් රක්නා ලද මිථිලා නම් රාජධානිය සිංහයකු විසින් රක්නා ලද රන් ගල් ගුහාවක් පරිද්දෙන් වෙන කිසි කෙනකුන් විසින් ගන්නට නොහැක්කී ය. ගියොත් හුදෙක් අපට ම ලජ්ජා වන්නී ය. ඔබ ගමන නොකැමැත්තෙමි" යි මෙසේ කීහ. රජ්ජුරුවෝ වනාහි රාජ මානයෙන් ද ඉසුරු මදයෙන් ද මත් වැ දණ්ඩකින් පහරන ලද සර්ප රාජයකු සේ කෝපයෙන් දිලිහී, "ඒ මහෞෂධයා කුමක් කෙරේ දැ?" යි කියා, එසේ ම අභිමානපුරස්සර වූ එක් සියයක් රජදරුවන් පිරිවරා වේරම්බ වාතයෙන් හැළ ලී ගිය අටළොස් අක්ෂෞහිණියක් සේනාවෙන් යුක්ත වැ නික්මුණාහ. කේවට්ටයෝ ද තමන්ගේ බස් රජ්ජුරුවන් සිතට නංවා ගත නොහී, 'රජ්ජුරුවන්ට පටහැණි වීම නම් යුක්ත නො වෙයි' සිතා, රජ්ජුරුවන් හා සමග නික්මුණාහ.

බෝධිසත්ත්වයන් වහන්සේ විසින් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ ජය පානය විධ්වංසනය කරන්නට එවන ලද්දා වූ දහසක් යෝධයෝ තමන් ආ කටයුතු සම්පාදනය කොට එක් දවසින් ම රාත්‍රිය මුළුල්ලෙහි ගොස් මියුලු නුවරට පැමිණ, තමන් කළ කටයුතු පණ්ඩිතයන් වහන්සේට දැන්වූහ. පළමු ඒ ඒ රජ්ජුරුවන් සමීපයට යවන ලද්දා වූ චර පුරුෂයෝ ද පණ්ඩිතයන් වහන්සේට, "චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ 'වේදේහ රජ්ජුරුවන් ගනුම්හ' යි එක් සියයක් රජුන් පිරිවරා එන්නාහ. පණ්ඩිතයන් වහන්ස, පමා නොවන සේක්ව" යි හසුන් එවූහ; "අද අසුවල් තෙන ලැගුම් ගත්තාහ. අද වනාහි නුවරට එන්නාහ" යි පණ්ඩිතයන් වහන්සේට නිරන්තරයෙන් හසුන් එවන්නාහ. ඒ අසා මහ බෝසතාණන් වහන්සේ වඩාලා ම කළ මනා විධානයෙහි නොපමා වූ සේක. වේදේහ රජ්ජුරුවෝ වනාහි "මේ නුවර ගන්නට එත් ල" යි පරම්පරා ශබ්දයෙන් ඇසූහ.

ඉක්බිති බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ පෙර සන්ධ්‍යාවෙහි ම ගන්නා ලද්දා වූ ලක්ෂ ගණන් දඬු වැට පහන් ආලෝකයෙන් ගොස් සියලු සත් යොදුන් මියුලු නුවර පිරිවරා ගත්හ. කෙසේ වට කොළෝ ද යත්:- පළමු කොට පා පොළෝ අගල වටා රන් සන්නාහ ලන ලද්දා වූ, රන් සැත්, රන් පොරෝදු ආදි හස්ත්‍යාලංකාරයෙන් සරහන ලද්දා වූ, සොඬින් ගන්නා ලද මුගුරු ඇති, ලෝහ ප්‍රාකාර වී නමුත් පිටින් ඇන සුනු විසුනු කරන්නට සමර්ථ ශක්ති ඇති, දෙකපොලය හා කෝෂය හා යන තුන් තැනින් වෑහෙන්නා වූ එක් මදයෙකින් ද එම යථෝක්ත ස්ථාන තුන හා දෙකන් සිදුරු හා දෙඇස් සිදුරු හා යැ යි යන සප්ත ස්ථානයෙන් වෑහෙන්නා වූ එක් මදයකින් ද සප්ත ස්ථානය හා දෙනාසාපුටය, ගුද මාර්ගය හා යන දශ ස්ථානයෙන් වෑහෙන්නා වූ එක් මදයෙකින් ද' යි මෙසේ ගිලිහෙන තුන් මදයෙකින් යුක්ත වූ, සර්වාභරණයෙන් විභූෂිත ජය අකුසු හා තෝමරාදි ආයුධ ගත් අත් ඇති ව පිට හිඳිනා ඇතරුවන් විසින් ගැවසී ගත්, ඒ රජ්ජුරුවන්ගේ කෝප නමැති ගින්නෙන් නැඟි දුම් කඳ සේ උස් වී, කන්තලින් කන්තල ගසා සිටුවන ලද්දා වූ ඇත් වළල්ලෙකින් ද යුද්ධයට ලන ලද්දා වූ සන්නාහ ඇති අශ්වාලංකාරයෙන් සරහන ලද සින්දු කාම්බෝජ යෝනකාදි උත්තම දේශයෙහි උපන්නා වූ නානාභරණ ප්‍රතිමණ්ඩිත වැ සන්නාහ සන්නද්ධ වැ පිට හිඳිනා අසරුවන් විසින් ගැවසී ගත් 'සතුරා හසු කොට ගනිමි' යි ඔද වැඩියා වූ රජ්ජුරුවන්ගේ සිත් නමැති ආකාශ ගංගායෙහි බිඳි-බිඳී දිවෙන්නා වූ රළපතර සේ යුද්ධයට පිඹිනා ලද කාහල ශබ්දයෙන් සතුටු වැ පැන-පැන සිටිනා වූ ග්‍රීවය ගසා සිටුවන ලද්දා වූ අස් වළල්ලෙකින් ද සිංහ සම්, ව්‍යාඝ්‍ර සම් ආදි සම් අතුරන ලද්දා වූ රථාලංකාරයෙන් සරහන ලද නඟන ලද නානා වර්ණ ධ්වජ පඞ්ක්ති ඇති, සෛන්ධවයන් යොදන ලද, සර්වාලංකාරයෙන් සැරැහී පිටැ බඳිනා ලද හියොවුරු ඇති වැ නැඟෙන ලද ධනුර්ධරයන් විසින් උපලක්ෂිත වූ සේනා නමැති සමුද්‍රයෙන් නැංගා වූ මහ තල් මස් කැල සේ රිය සකින් රිය සක ගසා සිටුවන ලද රථ වළල්ලෙකින් ද 'සිද්ධාර්ථ කුමාරයන් සම තිස් පැරුම් පුරා මුළු කොට ගෙන බෝධි ද්‍රැමයෙක පිටිවහල් ලදින් සත් තිස් බෝධිපාක්ෂික ධර්ම සංඛ්‍යාත යෝධයන් බල කොට ගෙන විදුරසුන් අරා බුදු වන්නට උන් වේලෙහි ජය ගැන්ම පිළිවන් වේ ව යි, නොපිළිවන් හෝ වේ ව යි, දුර තබා ම අන්‍යතර ජාතියෙක අන්‍යතර යුද්ධයක් කොට බැලුව මැනැවැ' යි සිතා චූලනී රාජ ව්‍යාජයෙන් ආ වශවර්ති මාරයාගේ සිංහ මුඛ, හස්ති මුඛ, අශ්ව මුඛ, ව්‍යාඝ්‍ර මුඛාදි වූ නොයෙක් භයංකර මුඛ මවා අසි, ශක්ති, තෝමර, හෙණ්ඩිවාල, කරවාලාදි වූ දීප්තිමත් නා නා විධ අවි ගනිමින් අනේක ප්‍රකාර විකාර වේශයෙන් ආ දස බිම්බරක්

මාර සේනාව සේ භයංකර වූ සේනාවෙහි බාහුවෙන් බාහුව ගසා සිටුවන ලද්දා වූ යෝධ වළල්ලෙකින් ද යි මෙසේ සතර වළල්ලෙකින් ඒ සත් යොදුන් මියුලු නුවර වට ලවා ඒ ඒ ස්ථානයෙහි බළ ඇණි සිටුවූහ.

මනුෂ්‍යයෝ ඔල්වර හඬ දෙන්නාහු, අත්පොළසන් දෙන්නාහු, පනන්නාහු, 'වටලා ගතුම්හ' යන සමාධියෙන් නටමින්, ගර්ජනා කරමින් සිට ගත්හ. අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාවෙහි නඟන ලද මිණි දඬු වැටෙහි ලක්ෂ ගණන් පහන් ආලෝකයෙන් ද එක් සියයක් රජ දරුවන් හා හස්ත්‍යශ්වාදි සේනාව හා පලන් ආභරණයෙහි ආලෝකයෙන් ද සියලු සත් යොදුන් මියුලු නුවර ඒ මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රඥ නමැති සූර්යයා පහළ ව සත්ත්වයන්ගේ සිත මෝහාන්ධකාර විගමනයෙන් හෙළි වූ කලක් පරිද්දෙන් ආලෝක විය. ඇතුන්ගේ කුඤ්ච නාදයෙන් ද අසුන්ගේ හේෂාරවයෙන් ද රථයෙහි චක්‍ර නාදයෙන් ද පා බළ සෙනඟෙහි ගර්ජනාවෙන් ද සක්, සින්නම්හර, තන්තිරිපට, ගැටපහටු, මහබෙර, පනාබෙර, රන් සක්, රිදී සක් ආදි වූ පඤ්චාංගික තූර්ය නාදයෙන් ද පොළොව පැළී යන පරිද්දෙන් වූයේ ය.

සේනකාදි වූ පණ්ඩිතවරු සතර දෙන මහත් වූ කෝලාහල ශබ්දය අසා කුමන අරගලයක් බවත් නොදන්නාහු වේදේහ රජ්ජුරුවන් සමීපයට ගොස් "දේවයෙනි, මහත් වූ කෝලාහල ශබ්දයෙක, අපි කුමක් බවත් නො දනුම්හ. 'කුමන අරගලයෙක් ද' යි විමසුව හොත් යහපතැ" යි කීහ. එ බස් අසා රජ්ජුරුවෝ, 'යළි බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් ආ වනැ' යි සී මැඳුරු කවුළුව හරවා පිටත බලන්නාහු, උන් ආ බව දැන භයින් ත්‍රස්ත වැ "ඉතිකින් අපගේ දිවි නැති. බ්‍රහ්මදත්තයා තෙමේ දුන් දුන් අප හැම මරන්නේ යැ" යි සේනකාදීන් හා සමග කථා කරමින් හුන්හ. මහ බෝසතාණන් වහන්සේ වනාහි චූලනී රජ්ජුරුවන් ආ බව දැන, සිංහයකු මෙන් කිසි භයක් නැති වැ නුවර මුළුල්ලෙහි රකවල් සකස් කොට ලවා 'රාජාදීහු භයින් දිලිහීලා හිඳිති. මා උන් අස්වසා ලුව මැනැවැ' යි රජ ගෙයි මතු මාලට නැඟී රජ්ජුරුවන් වැඳ එකත් පස් වැ සිටි සේක. රජ්ජුරුවෝ මහ බෝසතාණන් වහන්සේ දැක ලබන ලද අස්වස් ඇති වැ, 'මපුතණුවන් මහෞෂධ පණ්ඩිතයන් විනා අනෙක් මා මේ දුකින් මුදන්නට සමර්ථ කෙනෙක් නැතැ' යි සිතා, පණ්ඩිතයන් වහන්සේ හා සමග කථා කරන්නාහු, "මහෞෂධ පණ්ඩිතයෙනි, පඤ්චාල දේශ වාසී වූ බ්‍රහ්මදත්ත රජ තෙමේ එක් සියයක් රාජධානියෙහි සියලු අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාව හා සමග ආයේ ය. පඤ්චාල රාජධානිය සන්තක වූ මේ සේනා තොමෝ මෙතෙකැ යි පමණ නැත්තී ය. ඉතා මහත් ද්වාරට්ටාල සාලාදි වූ නොයෙක් කර්මාන්තයට පිටින් ගෙන එන්නා වූ දැව පත්‍ර, සංගාලියම්, වෙට්ටම් ලැලි ආදි වූ දාරු සම්භාරයන් ගෙන ඇවිදිනා වඩු සෙනඟින් යුක්ත වුව; සියලු සංග්‍රාමයෙහි දක්ෂ වූ ඇතුන් අසුන් ආදි වූ බළ සෙනඟ ඇත්තී ය. ගහන බැවින් තමා අතුරට වන්නවුන් නොපෙනෙන පරිද්දෙන් පය බිම ගැවිය නො දී උර පිටින් ගෙන යන්නී ය; හස්ති ශබ්ද යැ, අශ්ව ශබ්ද යැ, රථ ශබ්ද යැ, වීණා ශබ්ද යැ මෘදංග ශබ්ද යැ, ගීත ශබ්ද යැ, තාල ශබ්ද යැ, 'විදුව, ගනුව, අනුව' යි මෙ සේ දශ විධ ශබ්දයෙන් යුක්ත වුව; ඇතුන් ආදි වූ සිවුරඟ සෙනඟෙහි පවත්නා නාදය මුහුදු පරගානා සේ පවත්නා හෙයින්, 'මුබ එව, ඔබ යව, යුද්ධ කරව, පමා නොවව,' යනාදි වූ ඒ ඒ කටයුත්තෙහි නියෝග වචන වාග් භේදයෙන් දන්වන්නට නොපිළිවන් හෙයින් මෘදංග, මද්දලාදි වූ නා නා ප්‍රකාර භේරි ශබ්දයෙන් හා සංඛ කාහල ශබ්දයෙන් හා හඟවන්නා වූ ඒ ඒ කටයුතු ඇත්තී ය; සත්

රුවනින් විසිතුරු වූ සන්නාහයෙන් හා ස්වර්ණ ජාල හස්ති කුන්ත විශේෂයෙන් ද රාජ රාජ මහාමාත්‍යාදීන් විසින් පළඳනා ලද්දා වූ කනක, කටක, රසනා, නූපුර, තාඩංක, වළය, තිසර පට, අවුල් හර, උදර බන්ධන, ගැට නිමුල් හර, පස් රූ පස් වළලු, පේරුස්, එක්වැටි, පාමුදු, පාඩගම්, පාසලඹ, පාදජාලා, පාදත්‍ර-පාදාභරණාදි වූ ශරීරාභරණයෙන් ද හොබනී ය. කනක රජතාදීන් විචිත්‍ර වූ රක්ත නීලාදි වූ නා නා වස්ත්‍රයෙන් සමුජ්වලිත රථාදියෙහි නඟන ලද නා නා ප්‍රකාර ධවලච්ඡත්‍ර පංක්තියෙන් ගැවැසී ගත්තී ය. ඇත් වාහන, අස් වාහන රථ වාහනයෙන් යුක්ත ය. හස්ති ශිල්ප යැ, අශ්ව ශිල්ප යැ, රථ ශිල්ප යැ, ධනුශ්ශිල්ප යැ ආදි වූ අටළොස් මහා ශිල්පයෙහි කෙළ පැමිණියන් විසින් විශේෂයෙන් සමෘද්ධ ය. මේ සේනා තොමෝ සිංහ සමාන වික්‍රම ඇත්තී ය. ශූර යෝධයන් විසින් සුප්‍රතිෂ්ඨිත ය. මේ සේනාවෙහි පොළොව හා සමාන නුවණ ඇති රහස් මන්ත්‍රණ කරනසුලු වූ හෙවත් දෙදවසක් තනි වැ හිඳ සිතුව හොත් මහ පොළොව පෙරළන්නට ද අහස හා පොළොව හා ගැට ලන්නට ද පොහොසත් වූ පණ්ඩිතවරු දස දෙනෙක් ඇත්තාහ. ඒ පණ්ඩිතවරුනට වඩා අධික වූ ප්‍රඥා ඇති රජ්ජුරුවන්ගේ මෑණියෝ තලතා දේවී පණ්ඩිතවරුන් දස දෙනාට එකොළොස් වැනි ව හිඳ චූලනී රජ්ජුරුවන්ගේ සේනාවට අනුශාසනා කරන්නාහු ය.

"වැළිදු ඒ තලතා දේවීන්ගේ ප්‍රඥාව කෙසේ ද යත හොත්:- එක් දවසක් මිනිසෙක් සාල් නැළියක් ද බත් මුළක් ද මසුරන් දහසක් ද හැරගෙන 'ගඟින් එතෙර යෙමි' යි ගඟ මැදට ගොස් දිය සැඩ සෙයින් එතෙර වැ ගත නොහී, එතෙර සිටි මිනිසුන්ට "පින්වත්නි, මා අතැ සාල් නැළියක් හා බත් මුළක් ද මසු දහසක් ද ඇති. මෙකී තුනින් මට යමක් රුචි වී නම් ඒ දෙමි; තොප හැම දෙනා කෙරෙන් යම් කෙනෙක් මා එතෙර කළ හොත් නම් ඌ මා එතෙර කෙරෙත්ව" යි මෙසේ කී ය, ඉක්බිති ශක්ති සම්පන්න පුරුෂයෙක් කච්චිය තර කොට හැඳ ගෙන ගඟට බැස ඒ පුරුෂයා අත අල්ලා ගෙන එතෙර කොට, "මට දිය යුතු දෙය දෙව" යි කී ය. ඒ තෙමේ "සාල් නැළිය හෝ බත් මුළ හෝ ගනුව" යි කී ය. ඒ අසා දියෙන් එතෙර කළ පුරුෂයා, "මම මාගේ ජීවිතය නොසලකා තොප එතෙර කෙළෙමි. මට සාල් නැළියෙන් හා බත් මුළින් හා ප්‍රයෝජන නැති. මසු දහස දෙව" යි කී ය. ඒ අසමින් "යමක් මට රුචි වී නම් ඒ දෙන්නෙමි, කීයෙමි. දැන් මට යමක් රුචි වී නම් ඒ දෙමි. කැමැත හොත් ගනුව" යි කී ය.

ඒ තෙමේ සමීපයෙහි සිටි එකකුට එපවත් කී ය. එයිත්, "යමක් තමනට රුචි වී නම් ඒ තොපට දෙමියි කියා වේ ද උන් කීයේ? උන් දෙනු කැමැති දෙයක් හැර ගනුව" යි කීයේ ය. ඒ පුරුෂයා උන් කී බසැත් නො සිට, "එසේ මා ගන්නේ නැතැ" යි ඔහු ඇරගෙන අධිකරණ නායකයන්ට සරුප කී ය. අධිකරණයේ ඇත්තෝ ද දෙන්නාගේ බස් අසා, "ඌ දුන් දෙයක් ගනුව" යි එ ලෙස ම කිවූ ය. ඒ පුරුෂයා අධිකරණ නායකයන්ගේ යුක්තියෙහි නො සිට රජ්ජුරුවන්ට දැන්වී ය. රජ්ජුරුවෝ අධිකරණ නායකයන් ගෙට ගෙන්වා ගෙන උන් මැදයේ දෙන්නාගේ බස් අසා, එලෙස ම කියා යුක්තිය පසිඳිනා සේ නොදන්නාහු, තමාගේ ජීවිතයෙහි ආසාවක් නැති වැ ගඟට බට තැනැත්තවු ම පැරැදවූහ. එවේලෙහි රජ්ජුරුවන්ගේ මෑණියෝ තලතා දේවී තුමූ එ තැනට නුදුරු තැනෙක හුන්නාහු රජ්ජුරුවන් යුක්තිය නපුරු කොට පසුන් බව දැන, "පුත, මේ යුක්තිය සලකා පියා කියව" යි කීහ. "මෑණියන් වහන්ස, මා දන්නේ මෙපමණෙක් ම ය. ඉදින් නුඹ වහන්සේ අමුත්තක් දන්නා සේක් වී නම් පසිඳුව මැනව" යි කීහ.

තලතා දේවී, "යහපත, යුක්තිය පසිඳිමි" කියා ඒ දියෙන් යන්නට සිටි පුරුෂයා බණවා, "මෙසේ එව දරුව, තොප අත තුබූ සාල් නැළියත් බත් මුළත් මසු දාසත් තුන පිළිවෙළින් බිම තබාලව" යි කියා පිළිවෙළින් ම තබවා 'තෝ දියෙන් යන්නෙහි මූට කුමක් කී ද?" යි විචාරා, 'මෙලෙස කීමි' කී කල්හි "එසේ වී නම් තට රුචියක් හැර ගෙන යව" යි කීහ. ඒ තෙමේ මසු දාහ අතට ගත. ඉක්බිති ඌ මඳ තැනක් ගිය කල බිසොවු ඌ ගෙන්වා, "දරුව, මසු දහස තොපට අභිප්‍රාය ද?" යි විචාරා, "එසේ ය, කැමැත්තෙමි" කී කල "දරුව, තොප විසින් මින් මට යමක් රුචි වී නම් ඒ දෙමී" මෝහට කියන ලද ද, නොකියන ලද දූ යි කියා, "කියන ලද ය, දේවයන් වහන්සැ" යි කී කල, "එසේ වී නම් මේ මසු දාස මෝ හට දෙව" යි කීහ. ඒ තෙමේ හඬමින් වලපමින් මසු දාස ඕ හට දුන්නේ ය. එ වේලෙහි රජ්ජුරුවෝ ද අමාත්‍යයෝ ද සතුටු වැ සාධුකාර දුන්හ. එ තැන් පටන් තලතා දේවීන්ගේ නුවණ දඹදිව මුළුල්ලෙහි පතළ වී ය. මේ නිසා ය මා 'චූලනී රජ්ජුරුවන්ගේ මෑණියන් තලතා දේවීන් එකොළොස්වනු වැ සේනාවට අනුශාසනා කෙරෙතී' යි කීයේ, නැවැත ඒ සේනාවෙහි පඤ්චාල රාජ්‍යයෙහි අනූන වූ පරිවාර සම්පත් ඇති බ්‍රහ්මදත්තයා විසින් හැර ගත් රට ඇති, මරණ භයින් තැති ගත් එක් සියයක් රජ දරුවෝ මේ චූලනී රාජයා සමග යෙති. අටළොස් අක්ෂෞහිණියක් සේනාවෙන් මේ මිථිලා නම් රාජධානිය වට ලා පළමු ඇත් පවුරෙක, දෙවැනි ව අස් පවුරෙක, තුන්වැනි ව රථ පවුරෙක, සතරවැනි වැ යෝධ පවුරෙකැයි මෙසේ සතර වළල්ලක් හා ඇත් වළල්ලට හා අස් වළල්ලට හා අතුරෙහි එක් වීථියෙක; අස් වළල්ලට හා රථ වළල්ලට අතුරෙහි හා එක් වීථියෙක; රථ වළල්ලට හා බළ වළල්ලට හා අතුරෙහි එක් වීථියෙක; මෙ සේ තුන් සන්ධියකින් වට කරන ලද වේදේහ රට වාසීන්ගේ මිථිලා නම් රාජධානිය හාත්පසින් කැණ උඩ නඟන කලක් පරිද්දෙන් පවුරු පදනම් බිඳ, දූන් සුනු විසුනු කරනු ලැබෙයි. මහෞෂධ පණ්ඩිතයෙනි, හාත්පසින් යම් බඳු සේනාවක් විසින් පිරිවරන ලද ද, ඒ සේනාවට මත්තෙහි පෙනෙන නොයෙක් සිය දහස් ගණන් මිණි දඬු වැට පහන් කරණ කොට ගෙන තරුවැලින් ගහන වූ ආකාශය වැන්න. පණ්ඩිතයෙනි, නුවණ නම් මෙ සේ වූ තැනට වේ ද? තොප හා සම නුවණැති කෙනෙක් නම් නැති, මෙ සේ වූ මහා සේනාවෙන් අපට ගැලැවීමක් කෙසේ වේ ද?" යි කීහ.

මෙසේ රජ්ජුරුවන් මරණ භයින් යුක්ත වැ කියන්නා වූ බස් අසා මහ බෝසතාණන් වහන්සේ, 'මේ රජ්ජුරුවෝ ඉතා මරණ භයින් භයපත් වැ ගියාහ. රෝගයෙන් පෙළෙන එකක් හට අවස්ථා පිළියමක් දන්නා වෙදකු පිළිසරණ වන්නා සේ ද සා දුකින් පෙළෙන එකකුට භෝජනය මුත් අනෙකක් පිළිසරණ නොවන්නා සේ ද පිපාසා ඇති එකකුට පැන් පුව හොත් මුත් ඒ පිපාසය නොසන්සිඳෙන්නා සේ ද මේ රජ්ජුරුවනට මා මුත් අනෙක් පිළිසරණක් නැති. රජ්ජුරුවන් අස්වසාලමි' යි සිතා ඉක්බිති රජ්ජුරුවනට මහ බෝසතාණන් වහන්සේ සැට යොදුන් රග්ගල් තලා මස්තකයෙහි නාද කරන ලද සිංහ රාජයකු මෙන් "නො බව මැනැව, දේවයන් වහන්ස, රාජ්‍ය සුව අනුභව කළ මැනැව, මම කැටක් ගෙන කපුටු රැසක් පලවන එකක්හු මෙන් ද දුන්නක් අල්ලා ගෙන වඳුරු මුළක් පලවන එකක්හු පරිද්දෙන් ද මේ අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාව බඩැ බන් කඩ පමණකටත් අස්වාමික කරවා නිගණ්ඨ සේනාවක් පරිද්දෙන් ඉස් ලූ ලූ අත ලුහුබඳවා පියමි. එය මට භාර ය. 'සටනෙකැ'යි සිතක් නො තබා භය නො ගෙන සුව සේ රාජ්‍ය ශ්‍රී අනුභව කළ මැනැවැ" යි කී සේක.

මෙ සේ කියා රජ්ජුරුවන් අස්වසාලා මාළිගයෙන් බැස නුවර බෙර ලවා හැම දෙනාට වදාරන සේක් "පින්වත්නි, තෙපි හැම 'සතුරෝ වටලා ගත්තෝ වේ දැ' යි නො සිතා, මල් ගඳ විලෙවුන් හා අටළොස් වර්ගයේ කැවුම් හා රා මස් ආදි නොයෙක් අන්නපාන සපයා වස්ත්‍රාභරණයෙන් සැරැහී උත්සවයට පටන් ගනුව; සමහර කෙනෙක් තොප තොපට සුදුසු පරිද්දෙන් බොවු නම් මහා පානයත් බොව; බෙර ගසව; ගී කියව; එළු සන්, ඔල්වර සන්, අසුරු සන් දෙව. සියල්ලක් නැති කෙනකුට මාගෙන් දෙමි. මහෞෂධ පණ්ඩිතයෝ නම් මම ය. කිසි භයක් නො කරව; මාගේ අනුභාව බලව" යි කියා අස්වසා වදාළ සේක. ඒ බසින් නුවර වාසීහු සත් අවුරුද්දේ පටන් ඔබගේ බල තමන් ඇම ඉඳුරා දන්නා හෙයින් කිසි භයක් නැති වැ සංකා රහිත වැ නැටුම් ආදි සියල්ලෙන් ම මහතාණන් වදාළ පරිද්දෙන් උත්සවයට පටන් ගත්හ.

යුද්ධෝපාය යෙදීම

නුවර ඇතුළෙහි ගී කියන වයන අරගල පිටත සිටි සතුරෝ අසන්නාහ. සතුරන්ගෙන් බොහෝ දෙන කුරුබිලියෙන් ඇතුළු නුවරට වදනාහ. සතුරු වැ ආ විටෙක මුත් දුටු දුටුවන් නො අල්ලන්නාහ. එ සෙ හෙයින් සතුරන්ගේ සඤ්චාරය නො සිඳෙන්නේ ය. නුවරට වන් වන් මනුෂ්‍යයෝ උත්සව කෙළනාත් ජය පානය බොන්නාත් ජන කෝලාහලත් දක්නාහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ඇතුළු නුවර කෝලාහල අසා සමීපයෙහි සිටියවුන්ට කියන්නාහු "පින්වත්නි, අටළොස් අක්ෂෞහිණියක් පමණ මේ සේනාව ගෙන'වුත් තමන්ගේ නුවර වටලා ගත් නියාවට කිසි භයක් වත් තැති ගැන්මක් වත් නැත්තේ ය. සන්තෝෂයෙන් යුක්ත වැ පස්වනක් ප්‍රීතින් පිනා ගියවුන් සේ අත්පොළසන් දෙන්නාහ; අඬ ගසන්නාහ; එළුසන් දෙන්නාහ; ගී කියන්නාහ; බෙර ගසන්නාහ. කොල කුමන අශ්චර්යයෙක් දැ?" යි කීහ. එ සේ කී රජ හට චරපුරුෂයෙක් බොරුවක් ගොතා ගෙන කියන්නේ, "දේවයන් වහන්ස, මම කිසි කටයුත්තක් නිසා කුරුබිලියෙන් ඇතුළු නුවරට වන්නෙමි. සැණකෙළි කෙළනා ජනයන් දැක, 'පින්වත්නි, සියලු දඹදිව රජ දරුවන් සේනා සහිත වැ අවුත් තොපගේ නුවර වට ලා ගෙන සිටිය දී තොප හැම මෙසේ ප්‍රමාද වැ වසන්නට කාරණා කිමි දැ"යි විචාළෙමි. ඔහු මට කියන්නාහු, 'අපගේ රජ්ජුරුවන් කුමාර කල මෙසේ වූ දොළෙක් විය. කෙසේ ද යත්: දස දහසක් යොදුන් දඹදිව රජුන් මුළුල්ල සේනාව පිරිවරා අවුත් මා උන් නුවර පිරිවරා සිටි කල සැණකෙළි කෙළිමී' යි දොළක් උපන. ඒ දොළ දැන් මුඳුන් පැමිණියේ ය. එබැවින් සත් දවසක් සැණකෙළි කෙළුව යි නුවර බෙර ලවා තමන් වහන්සේ මාළිගයේ මතු මහලේ අමාත්‍ය මණ්ඩලය පිරිවරා හිඳ මහා සන්තෝෂයෙන් මත් වැ ජය පානය බොන සේක් යැ' යි කීහ. මම එ බස් අසා 'රජකු බොළඳ නියා යැ' යි නින්දා කෙළෙමි' යි කී ය.

බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එ බස් අසා දණ්ඩෙන් ගසන ලද ආශීර්විෂයක්හු මෙන් ක්‍රෝධයෙන් දිලිහී කිපුණාහු "කොල, වහා මේ නුවර ඒ ඒ දිගින් අගල මැඩ හස්වා පවුරු, දොරටු, අටලු, වාසල්, බලකොටු ආදිය බිඳ, සුනු විසුනු කෙරෙමින් වහා නුවරට වැද, ගැල් පුරා ගෙන'වුත් කොමඩු බානා සේ මහා ජනයා ඉස් කපා ගනුව; වේදේහ රජහු ඉසත් වහා ගෙනෙව" යි කීහ. එ බස් අසා බලසම්පන්න යෝධයෝ නොයෙක් ආයුධ ගත් අත්

ඇතිව, "නුවර ගනුම්හ" යි පවුරු වාසල් සමීපයට ගියාහු, බෝධිසත්ත්වයන් වහන්සේගේ යෝධයන් විසින් දමන ලද කලල් වැලි ආදියෙන් මහා විනාශයට පැමිණ නුවර බිඳිනා තබා පවුර සමීපයටත් යා නොහී, නැවත යන්නාහ. ඉදින් සමහර කෙනෙක් නොනැවත, "පවුර බිඳුම්හ" යි වාසි කියා සාහසික වැ ගොස් අගලැ බටවු නම් අන්තරට්ටාලවල සිටියෝ ඊ, දඬු, මූණ, කොහොල්, තෝමර, හෙණ්ඩිවාලාදීන් දමා මහා විනාශයට පමුණුවන්නාහ. බෝධිසත්ත්වයන් වහන්සේගේ යෝධයෝ බ්‍රහ්මදත්තයන්ගේ යෝධයනට අතින් මුහුණින් උසුළු පෑ නොයෙක් ප්‍රකාරයෙන් ආක්‍රෝෂ පරිභව බෙණෙමින් ගහට කරන්නාහ. මච්ඡ මාංස හා කන බොන දෑ හා රා විත් ඔඩම් ආදිය පුරා ගෙන පිටත සිටියවුන්ට දික් කොට පුළු ගන්වා නැවත තුමූ ම කන්නාහ; බොන්නාහ. මෙසේ සතුරන් කිපෙනසුලු වූ නොයෙක් විකාර කෙරෙමින් පවුරින් ඇතුළේ පදනමැ උන්ට පෙනෙන නියාවෙන් සක්මන් කරන්නාහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ යෝධයෝ උනට කිසිවකුත් කොට ගත නො හී ගෙඩි බැට කා, අත පය හිස නළලැ ලේ පිස පසු බල-බලා දිවන්නාහු, රජ්ජුරුවන් සමීපයට ගොස් "දේවයන් වහන්ස, ඍද්ධිමත් කෙනකුන් ආකාශයෙන් ගොසින් වදුත් මුත් මිනිසුන් විසින් මේ නුවර වදනා තබා සිතන්නටත් බැරි යැ" යි කීහ. එබස් අසා රජ්ජුරුවෝ නොසතුටු වැ කීප දවසක් රඳා නුවර ගන්නා උපායක් නොදන්නාහු කේවට්ටයා විචාළහ; "ආචාරීනි, නුවර ගන්නා තබා පවුර ළඟට යන්නටත් සමර්ථ එක ද සත්ත්වයෙක් නැති. කුමක් කරමෝ ද?" යි කීහ. එබස් අසා බමුණා කියන්නේ, "වන්නා ව මහ රජ, නුවරට පැන් නම් පිටතින් වන්නේ ය. කීප දවසක් පැන් නවතා ලන්නා පැන් නොලදින් ක්ලාන්ත වූවාහු දොර ඇර පියන්නාහ. එවිට අපි සිත් වූ පරිද්දෙන් සතුරන්ට කට යුතු කියම්හ" යි කී ය. "කොල, එයින් උපායකැ"යි එතැන් පටන් පැන් වැද්ද නො දෙන්නාහ. එපවත් බෝධිසත්ත්වයන් වහන්සේගෙන් රජහු සමීපයෙහි සිටි චර පුරුෂයෙක් පතක ලියා ඊ දණ්ඩක බැඳ, ඇතුළු නුවරට විද පී ය. බෝධිසත්ත්වයන් වහන්සේ ද සතුරන් ආ දවස් විධානයක් කරන සේක්, "යමෙක් ඊදණ්ඩක බැඳ විද පී පතක් දුටුයේ වී නම් වහා ගෙන'වුත් මට දෙව" යි වදාළ සේක. එ බැවින් එක් පුරුෂයෙක් ඒ පත ගෙන'වුත් දින.

ස්වාමි දරුවාණෝ ඒ බව දැන 'මේ කේවට්ට මහල්ලා ඇතුළු වූ අඥාන ජඩයෝ මා තව ම මහෞෂධ පණ්ඩිත බව නොදන්නා වන්හ' යි සිතා, සැට රියන් උණ දණ්ඩක් ගෙන්වා සරියේ දෙකක් කොට පළා ඇතුළ පිට ගැට හරවා ශුද්ධ කොට නැවත එක් කොට තබා සමින් වසා බඳවා පිට මැටි ගාවා තපස්වීන් ලවා හිමාලයෙන් ගෙන්වූ මැටි හා ඇඹුල බිජු හා ගෙන පොකුණු අසැ දියෙහි බිජුවට රෝපණය කරවා මැටි පිට උණ දණ්ඩ සිටුවා ඇතුළේ පැන් පුරවා ලූ සේක. එක රැයින් ම පැළය නැඟී උණ දණ්ඩ මුඳුනින් රියනක් පමණ වඩා මලෙක් පිපී සිටියේ ය. ඒ අභිමතාර්ථසාධක වූ චින්තා මාණික්‍යයක් බඳු වූ මාගේ ස්වාමි දරු වූ බෝධිසත්ත්වයන් වහන්සේ ඒ මල් දඬු මුලින් උදුරුවා "මේ බ්‍රහ්මදත්ත රජ්ජුරුවනට දෙව" යි තමන් වහන්සේගේ පුරුෂයන්ට දුන්හ. ඔහු ඇඹුල දණ්ඩ වළල්ලේ ලා "කොල, බ්‍රහ්මදත්තයන්ගේ පුරුෂයෙනි, සයින් නො මියැ තෙල මල කඩා හිස පැලඳ ගෙන ඇඹුල දඬු හුයා ගෙන බඩ පුරා කා පියව" යි පවුරින් පිටත දමා ලූහ.

එයිත් බෝධිසත්ත්වයන් වහන්සේගෙන් ම සිටි චර පුරුෂයෙක් හැර ගෙන රජ්ජුරුවන් සමීපයට ගොස්, "බැලුව මැනව, දේවයන් වහන්ස, මෙබඳු ඇඹුල මලක් හා මේ සා දිග ඇඹුල දණ්ඩක් දුටු විරූ දෑ නැතැ" යි කී ය. රජහු, "මැන බලව" යි කී හෙයින්,

චර පුරුෂයා මනන්නේ සැට රියන් දණ්ඩ අසූ රියන් කොට මැන පී ය. රජහු "මේ කෙසේ වූ තැනක ඇති වී ද?" යි කී හෙයින්, ඉන් ම එකෙක් රජහු කටින් බස උදුරා ගත්තා සේ බොරුවක් ගොතා ගෙන කියන්නේ, "මම එක් දවසක් රා ටිකක් බී පියනු කැමැති ව කුරුබිලියෙන් ඇතුළු නුවරට වන්නෙමි, නුවර වාසීන් දිය කෙළිනා මහ පොකුණක් දිටිමි. බොහෝ මනුෂ්‍යයෝ ඔරු අඟුළු ආදියෙහි ඉඳගෙන මල් කඩා දිය කෙළ ඇවිදිනාහ. මේ වූ කලි ඒ පොකුණේ ගොඩ අස පිපි මලක සැටි ය. ඉදින් ගැඹුරු තැනෙක පිපි මලෙක් වී නම් සියක් රියනටත් වඩා ඇත්තේ වේ ද" යි කී ය. ඒ අසා, "ආචාරීනි, 'පැන් නවතා මේ නුවර ගනුම්හ' යි නො සිතව. ඒ තොපගේ උපායෙක් නො වෙයි" කීහ.

"එ සේ කල දේවයන් වහන්ස, මෙ විට මා සිතූ දෙය ඉතා ම යහපත. නුවරට වී සාල් නම් පිටතින් ම වන්නේ ය. ඒ වී සාල් වැද්ද නො දෙම්හ. බතින් පීඩිත වූ මනුෂ්‍යයෝ දොර හැර පියන්නාහ. එවිට අල්ලා ගෙන කැමැත්තක් කරම්හ" යි කී ය. ඒ මන්ත්‍රණයත් පළමු පරිද්දෙන් ම පතෙකින් දන "මේ තිවට වූ කේවට්ටයා මා නුවණැති නියාව නොදන්නා වනැ" යි කියා, අනුප්‍රාකාර යැ යි කියන ලද පදනම් මුඳුනේ කලල් අතුරුවා, ඊ පිට වී ඉස්වාලූ සේක. බෝධිසත්ත්වයන්ගේ අභිප්‍රාය නම් සිද්ධ වන්නේ ය. එබැවින් එක රැයින් පැළ නැඟී සත් යොදුන් මියුලු නුවර වටා පවුරු මුඳුනින් ඉතා නිල් වලා සමූහයක් සේ අතිනීල වැ පෙනෙන්නට වන. ඒ දුටු රජ්ජුරුවෝ, "පවුරු මුඳුනේ ඉතා නිල් වැ අර මේ පෙනෙන්නේ කිම් ද?" යි සිටියවුන් විචාළහ. චර පුරුෂයෙක් කියන්නේ "දේවයන් වහන්ස, ගොවියා පුත් මහෞෂධ පණ්ඩිතයා තමා ප්‍රඥ බලයෙන් මතු වන්නා වූ භය දන, තමාගේ විධාන වැටෙන්නා වූ මේ ජනපදයෙහි වී ටිකක් ඇයි තිබී ද යි එක හෙළා ගෙන්වා ගෙන මේ සා මහත් නුවර හැම දෙනාගේ කොටු ගෙවල් පුරවා, ඉතිරි වී පවුර පිට හා වීථියේ ඒ ඒ ස්ථානයෙහි හා ලවා පී ය. ඒ වී තාක් මුළුල්ල අවුවේ වියළී වැස්සේ තෙමී පැළ නැඟී ගොයම් වැ ගියේ ය. මම එක් දවසක් කටයුත්තක් පිණිස කුරුබිලියෙන් ඇතුළු නුවරට වන්නෙමි පවුර අසැ තුබූ වියෙන් වී ටිකක් ඇර ගෙන "කොල, ඉතා යහපත් වීයෙක, ඉස්නෙමි, කියා වීථියට දමා පීමි. ඒ දක එතැන සිටි ජනයෝ මා වෙහෙසන්නාහු, "ඉතා ම බඩ සා සැටි ය. කැමැත්තෙහි වී නම් තිලින් පොදියක් කොට බැඳ ගෙන ගොස් පැහැර පියා පිස ගෙන බඩ පුරා කා නො මිය" යි කීහ. "ඒ වී මා ඇල්ලූ සේ ඉතා නපුරැ" යි මම ලජ්ජාවට පැමිණියෙමි" යි කී ය. ඒ අසා රජ කේවට්ටයාට කියන්නේ "වී නවතාත් මේ නුවර ගත නොහැක්ක. තාගේ එයිත් උපායෙක් නො වෙයි. හැර පියව" යි කීහ.

"දේවයන් වහන්ස, නොසිතා වදාළ මැනව, අනෙක් බලවත් මාගේ උපායෙක් ඇති. නුවර ඇතුළේ වලක් නැති හෙයින් දර නම් පිටතින් ගෙන මුත් නොහැක්කේ ය. දර නවතා ලා නුවර ඇර ගනුම්හ" යි කීයේ ය. ඒ මන්ත්‍රණයත් පෙර පරිද්දෙන් ම දන වදාරා පවුරු පිටින් වී හා ගොයම් හා හරවා පිටතට පෙනෙන නියායෙන් දර රැස් කරවා පී සේක. පවුරේ උන් මනුෂ්‍යයෝ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ යෝධයනට සිනා සිසී වෙහෙසන්නාහු "කොල, දර නැති වැ පිස කෑ නොහී සයින් පීඩිත වැ නො හිඳ, නැති කෙනෙක් උළු කැන් බත් ආදිය පිස කව; බොව" යි කියමින්, "තෙල ඇර ගන්ව" යි මහත් දර කඳන් ඇඟට දමා ලන්නාහ. සමහරු ඒ වැද ගෙන තැළි-තැළී මහත් දුක්ට පැමිණෙන්නාහ. රජ්ජුරුවෝ දර රාශිය පෙනෙන්නා දක "තෙල කිමෙක් ද?" යි විචාළහ. එතැන ද සිටි චර පුරුෂයන්ගෙන් එකෙක්, "ඇයි මහ රජ, නො දන්නා සේක් ද? ගොවියා පුත් මහෞෂධයා මතු වන්නා වූ

හය දන වලැ දරෙක් තිබී ද? එක හෙළා අද්දා ගෙන'වුත් නුවර ගෙයක් පණහා පැළ දෙරවල් පුරා ලා ඉතිරි වන දර පවුරු පිට රැස් කරවා පී යැ" යි කී ය. ඒ අසා කේවට්ටයාට "මේ නුවර දර නවතාලා ඇර ගන්නට නොපිළිවන. තාගේ එයිත් උපායෙක් නො වෙයි. ඇර පියව" යි කීහ. ඉතා ඇවිලි අවන්නා වූ නිවට වූ කේවට්ටයා කියන්නේ, "මහරජ, නො සිතා වදාළ මැනව. මාගේ බලවත් අනෙක් උපායක් ඇතැ" යි කී ය. ඒ අසා "ආචාරීනි, උපාය නම් තමා කිම් ද? මේ සා මහත් වූ තොපගේ උපායෙකින් වැඩකුත් නිමාවකුත් දුටු දෑ නැති. මෙ නුවර වේදේහ රජු අල්ලා ගන්නට නොපිළිවන. එබැවින් අපගේ නුවරට යම්හ" යි කීහ.

ධර්ම යුද්ධය

නැවත අඥාන වූ මහලු බමුණු කියන්නේ, "දේවයන් වහන්ස, 'බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එක් සියයක් රජ දරුවන් හා ඒ සා මහත් චතුරංගිනී සේනාවන් ගෙනවුත් වේදේහ රජු අල්ලා ගත නො හී පැරැද පලා ගියහ' යි අපට මහත් ලජ්ජා වන්නී ය. නුවණැත්තෝ නම් මහෞෂධ පණ්ඩිතයෝ මතු නො වෙති. මමත් මහා නුවණැත්තෙමි. එක් ලෙසකින් ඔහු පරදවා පියම්හ" යි කී ය. "ආචාරීනි, එ ලෙස නම් තමා කිම් දැ?" යි කී හ. "ධර්ම යුද්ධය නම් දෙයක් කෙරෙමි" යි කී ය. "ධර්ම යුද්ධ නම් කිම් දැ?" යි කීහ. "මහරජ, දෙසේනාව සටන් නොකොට මැනව, රජ දරුවන් දෙදෙනාගේ පණ්ඩිත දෙදෙන එක තැනකට එද්ද, ඉන් එක් කෙනෙක් වැන්දවු නම් වැඳි පක්ෂයේ රජ හට පරාජය වන්නේ ය. වැඳුම් ලත් පක්ෂයේ රජ හට ජය වන්නේ ය. ඒ මන්ත්‍රණ මහෞෂධ පණ්ඩිතයෝ නොදන්නාහ. මම ඉතා වැඩිමහල්ලෙමි. මහෞෂධ පණ්ඩිතයෝ බාලයෝ ය. ආචාර දන්නා නුවණැති පණ්ඩිතයන් හෙයින් ඔහු මා දුටු කල සැක නැති වැ වඳනාහ. එවේලෙහි වේදේහ රජු සැබැවින් පැරැද්දා නම් වන්නේ ය. එ සේ කොටත් වේදේහ රජු පරදවා පියා නැඟී යම්හ. එසේ කලැ අපට ලජ්ජා නොවන්නී ය. ධර්ම යුද්ධ නම් මේ යැ" යි කීහ. එසේ රහස් කථාවත් පෙර පරිද්දෙන් ම දන වදාරා, 'කේවට්ටයාට මිනුත් මම පැරැද්දෙමි නම් මාගේ කුමන පණ්ඩිත කමක් දැ?" යි සිතූ සේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත්, "ආචාරීනි, ඒ උපාය ඉතා යහපත, සෙට උදෑසන ධර්ම යුද්ධ වන්නේ ය. ඉදින් ධර්ම යුද්ධයට නො අවු නම් එයිත් පැරැද්දා නම් වන්නේ යැ" යි ලියා කුරුබිලියෙන් වේදේහ රජ හට යැවූහ.

ඒ අසා වේදේහ රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන් දැ කැඳවා එ පවත් කී හ. ඒ අසමින් සකල ජනානන්දකර වූ තිලෝගුරු බෝධිසත්ත්වයන් වහන්සේ "යහපත, දේවයන් වහන්සැ" යි කියා, බස්නාහිර වාසලින් පිටත ධර්ම යුද්ධ මණ්ඩලය සැරැහූ සේක. එතෙකුදු වුවත් ඒ ඒ රජුන් කෙරෙහි සිටි චර පුරුෂයෝ එක් සියයක් දෙන, 'කවුරු දනිද්ද, කිම් ද' යි බෝධිසත්වයන් වහන්සේට ආරක්ෂාව පිණිස කේවට්ටයා පිරිවරා සිට ගත්හ. බ්‍රහ්මදත්තයන් හා එක් සියයක් රජදරුවෝ ධර්ම යුද්ධ මණ්ඩලයට ගියාහු පුර දියවක යහපත් දවස් සඳ බලන්නට එක් සිත් වැ එක දිසාව බලන්නවුන් පරිද්දෙන් පැඳුම් දිග බලා සිටියහ. එසේ ම නිවට වූ කේවට්ටයාත් නැඟෙනහිර දිසාව බල-බලා "කල් යේනු, කල් යේනු" යි කිය-කියා සිටියේ ය.

තමන් පා පියුම් ලෝ මුදුන් කළ තිලෝගුරු බෝධිසත්ත්වයන් වහන්සේ, එ දවස් උදෑසන

සොළොස් කළයක් සුවඳ පැනින් ඉස් සෝධා නහා ලක්ෂයක් අගනා කසී සළුවක් හැඳ සර්වාභරණයෙන් විභූෂිත වැ, නොයෙක් රසයෙන් අග්‍ර වූ, අමරා දේවීන් විසින් පිසින ලද භෝජනය අනුභව කොට, මහත් පෙරහරින් වාසල් දොරකඩට ගොස්, ආ නියාව කියා යවා "මපුතණුවෝ වහා එත්ව" යි රජ්ජුරුවන් විසින් කී කල්හි රජ ගෙට වැද, රජ්ජුවන් වැඳ එකත්පස් වැ සිට, "කිමෙක් ද පුත, මහෞෂධ පණ්ඩිතයෙනි?" යි රජ්ජුරුවන් කී කල්හි, "ධර්ම යුද්ධයට යෙමි" යි වදාළ සේක. "පුත මා විසින් කුමක් කළ මනා ද?' යි කීහ. "දේවයන් වහන්ස, කේවට්ටයා මැණිකෙකින් වඤ්චා කරනු කැමැත්තෙමි. එ බැවින් අෂ්ටවංක මාණික්‍ය රත්නය ලද මැනැවැ" යි වදාළ සේක. "පුත, එයිත් මට කියා ද ගන්නේ? ඇර ගන්ව" යි කී කල්හි, ශක්‍රයන් පළමුත් තමන් වහන්සේට දුන් මාණික්‍ය රත්නය ශ්‍රී හස්තයෙන් ගෙන, රජහු වැඳ මාළිගයෙන් බට සේක; තමන් වහන්සේ හා එක දවස උපන් යෝධයන් දහස හා සිවුරඟ සෙනඟ හා පිරිවරා, අනූ දහසක් රන් වටනා හැළි අසුන් යොදන ලද, සර්වාලංකාරයෙන් සැරහූ රථයකට පැන නැඟී, දවල් මේ නිමවන වේලාවට වාසල සමීපයට පැමිණි සේක.

කේවට්ටයෝ ද 'මහෞෂධ පණ්ඩිතයන් දූන් එතී, දූන් එතී' මහ බෝසතාණන් වහන්සේ වඩනා පෙර මඟ කර ඔසවා-ඔසවා බලා ගෙන සිටීමෙන් කොක් කරක් සේ දික් වූ කර ඇති වූහ; මහා බෝධිසත්ත්වයන්ගේ දිගන්තරයෙහි පතළා වූ තේජස් පරිද්දෙන් පහරන්නා වූ හිරු රැසින් ඩා වැහෙන්නා වූ ශරීර ඇති වූහ. මහ බෝසතාණන් වහන්සේ ද, ඔද වැඩියා වූ සාගරය පරිද්දෙන් පොළොව මැඩ පියන්නා සේ වීර්‍ය පුරා ගෙන යන්නා වූ ඇත් අස් ආදි වූ පරිවාරයෙන් යුක්ත වැ අසම්භීත වැ, වාසල් දොර හරවා, නුවරින් නික්ම, රථයෙන් බැස, කෙසරු සලා විදහා කිලිපොළන්නා වූ සිංහ රාජයකු සේ විජෘම්භනය කෙරෙමින්, ධර්ම යුද්ධ මණ්ඩලයට ම වැඩි සේක. එක් සියයක් රජ දරුවෝ ඒ මහතාණන් වහන්සේ රූපෛශ්වර්යය දක, 'නුවණින් සියලු දඹදිව තමන්ට දෙවන, කෙනකුන් නැති, සිරිවඩ්ඪන සිටාණන් පුතණුවෝ මහෞෂධ පණ්ඩිතයෝ නම් මොහු යැ' යි සමාධීන් ඔල්වර හඬ සිය ගණන් පැවැත්තූහ. පණ්ඩිතයන් වහන්සේ ද දෙව්ලොව දෙවියන් පිරිවරා අසුර යුද්ධයට නික්මුණු සක්දෙව් රජහු පරිද්දෙන් උපමාවිෂයාතික්‍රාන්ත වූ ශ්‍රී සෞභාග්‍යයෙන් යුක්ත වැ ඒ අෂ්ටවංක මාණික්‍යරත්නය අතින් ගෙන, කේවට්ටයන් ඉදිරියෙහි ළංව වැඩි සේක.

කේවට්ට බමුණා මහ බෝසතාණන් වහන්සේ දක, ඔබගේ තේජසින් සිටි පළ සිටින්නට අපොහොසත් වැ පෙර ගමන් කොට, "මහෞෂධ පණ්ඩිතයෙනි, අපි දෙන්නමෝ ම පණ්ඩිතවරුම්හ. තොප නිසා අවුත් මෙතෙක් කල් මෙතැන වසන අපට තෙපි අමුතු පඬුරක් පමණ වත් නොඑවූ විරූ ය. කුමක් නිසා ද මෙසේ ම සාදරයක් නොකළෝ?" යි කී ය. එසේ කී කේවට්ටයන්ට බෝසතාණන් වහන්සේ "පණ්ඩිතයෙනි, තොපට සුදුසු පඬුරක් සොයන්නෙම් අද මේ මිණි රුවන ලදිමි. හැර ගනුව. මෙ බඳු මිණි රුවනක් මේ මුත් නැතැ" යි වදාළ සේක. කේවට්ටයෝ පණ්ඩිතයන් වහන්සේ අත දිලියෙන මිණි රුවන දක, 'මේ පණ්ඩිතයෝ මට මිණි රුවනක් ගෙනා වන්නාහ' යි සිතා, "එසේ වී නම් දෙව" යි අත දික් කළහ. බෝසතාණන් වහන්සේ ද "හෙ ද ගනුව" යි අත දික් කොට, අත ඇඟිලි අග මැණික එළාලූ සේක. බමුණාණෝ බර වූ මිණි රුවන ඇඟිලි අගින් රඳවා ගත නුහුණුවහ. මැණික පෙරළී ගෙන ගොස් බෝසතාණන් වහන්සේගේ පාමුල වැටී ගියේ ය.

බමුණාණෝත් ලෝභයෙන් 'මැණික ගනිමි' යි බෝධිසත්ත්වයන් වහන්සේගේ ශ්‍රී පාද මූලයට නැඹුරු වූහ. ඒ දැක බෝසතාණන් වහන්සේ බමුණා නැඹුරු වූ තැනැත්තවු කර ඔසවා ගත නොදී ම එක් අතෙකින් පිටිකර හා එක් අතෙකින් පිටි මුල හා තරයේ අල්ලා ගෙන, "නැඟී සිටුව! ආචාරීනි, නැඟී සිටුව! ආචාරීනි, මම බාලයෙමි; තොපගේ මුනුබුරු තරමට ඇත්තෙමි. මා නො වඳුව" යි කිය-කියා මුබය හා සමග නලළ පෙරළ-පෙරළා කොරසැඩි බිම උලා රත් වද මලක් සේ ලේ හා පස් හා වකා, "නුවණ නැත්තව, තෝ මා අතින් වැඳුම් ගන්නට සිතයි ද?" යි බොටුව අල්ලා ගෙන දමා ලූ සේක. මෙ තෙමේ ඉස්බක් පමණ තැන වැටී ගොස් නැඟී සිට වැලි පිස-පිස පලා ගියේ ය. මැණික වනාහි මහ බෝසතාණන් වහන්සේගේ මිනිස්සු ම ඇර ගත්හ.

"නැඟී සිටුව! ආචාරිනි, මා නො වඳුව" කියා මහ බෝසතාණන් වහන්සේ බැණ නැඟි හඬ සියලු චතුරංගිනී සේනායෙහි අරගල මැඬ ගෙන සිටියේ ය. "කේවට්ට බමුණා විසින් මහෞෂධ පණ්ඩිතයන් වහන්සේගේ පා වඳනා ලද" යි සියලු පර්ෂත් කොක් සන් දී පිළී හිස සිසාරා අත්පොළසන් දී කෝලාහල කළහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා එක් සියයක් රජ දරුවන් හා ඇතුළු හැම දෙන ම කේවට්ටයා මහෞෂධ පණ්ඩිතයන් පා පිට නැමුණා දුටුවාහු ම ය. නැවත කියන්නාහු, "අපගේ කේවට්ට ආචාරීන් විසින් මහෞෂධ පණ්ඩිතයෝ වඳනා ලද. එ බැවින් අපි පැරැද්දම්හ. අපගේ ජීවිතය මෙ විට නො දෙන්නාහ" යි හයින් තැති ගෙන, තමන්-තමන්ගේ අසුන් පිට නැඟී උත්තර පඤ්චාල නුවරට මූණ ලා නමා ගත්හ. ඒ යන්නවුන් දැක බෝධිසත්ත්වයන් වහන්සේගේ පිරිස එක පැහැර කියන්නාහු, "කොල බ්‍රහ්මදත්ත රජු එක් සියයක් රජුන් හා සේනාව හා ඇරගෙන බිඳී පලා යන්නාහ" යි මහත් කොට හඬ ගසා කෝලාහල කළහ. ඒ අසා රජදරුවෝ තාක් මුළුල්ල වඩ-වඩා හයපත් වැ පලා යන්නාහු ම ය. ඔවුනොවුන් නො බලා මහා සේනාවෝත් බිඳී ගියහ. බෝධිසත්ත්වයන්ගේ පිරිස ඒ දැකත් වඩ-වඩා කෝලාහල පැවැත්වූහ. කරුණානිධාන වූ මාගේ ස්වාමිදරුවාණෝ 'බිඳී යන්නවුන් ලුහුබඳව' යි යන බසකුත් නො කියා, තමන් වහන්සේගේ සේනාව පිරිවරා නුවරට වත් සේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා ඒ සා මහත් සේනාව හා දොළොස් ගව්වක් තැන් බිඳී පලා ගියහ.

ඉතා අලජ්ජී වූ දුෂ්ට වූ කේවට්ටයා අසු නැඟී, කටින් ලේ දම-දමා නළලේ ලේ පිස-පිස දිවන්නේ ය; සේනාවට ආසන්න ව අසු පිට ම හිඳ, "පින්වත්නි, නො යව; මම ගොවියා පුතු නොවැන්දෙමි. සිටුව, සිටුව" යි කී ය. එසේ කීවත් සේනාව නොරඳා ම දිවන්නාහු මෙසේ කියන්නාහ: "කොල පවිටු දුෂ්ට අධර්මිෂ්ඨ වූ නිකෘෂ්ට අනාචාර ස්වරූප ඇති අවලක්ෂණ වූ අඥාන බමුණු මහල්ල, තෝ, 'ධර්ම යුද්ධය කෙරෙමි' යි කියා ගොසින් තට මුනුබුරු තරමටත් නැති ඉතා බාල තැනැත්තන් වැඳ පී ය. මේ මනුෂ්‍ය ලෝකයෙහි උපන් සත්ත්වයන්ගෙන් ජඩ වූ යම් එකක්හු කළ මනා යම් නොකටයුත්තක් ඇති නම් ඒ සියල්ලෙන් තා විසිනුත් නොකළමනා දෙයක් ඇද්ද? ජඩය, මැත නොදොඩා තොයිත් තාගේ පණ නො නසා යන අතෙක නැඟී යා" යි යනාදීන් කිය-කියා ඔහුගේ බස් තමන් කනෙක නො හෙළා ඕ හට ආක්‍රෝශ පරිභව බෙණෙමින් නොරඳා ම දිවන්නාහ.

එ බමුණා වහ-වහා ම දිව ගෙන ගොස් සේනාව මැදට පැන මෙසේ කියා ලී ය: "ඇයි? කුමක්

කියවු ද? මම ගොවියා පුතු නොවැන්දෙමි. මම ගොවියා පුතු නොවැන්දෙමි. කොල, වඳනා කෙනෙක් නළල දණ වැලමිටි ලේ ලා ගෙනත් වඳිද්ද? මේ වැඳීම් මාන තොප අතින් අද ඇසීමි! ඒ ගොවියා පිත් මාණික්‍ය රත්නයෙකින් මා වංචා කොට පී යැ" යි නොයෙක් කාරණ කියා ගිවිස්වා තමා වසඟ කොට, එසේ මිදී තුන් යොදුනක් පලා ගිය ඒ සා මහත් සේනාව රඳවා නැවත ගෙන'වුත් පළමු පරිද්දෙන් මැ වට ලා ගත. බෝධිසත්ත්වයන් වහන්සේගේ අනුභාවයෙන් නො සිතු හෙයින් මුත් ඉදින් ඒ සේනාව එක් එක් පස් මිටක් වත් දමුයේ වී නම් අගල් තුන පුරා ගෙන අටළොස් රියන් පවුර පිට නැවත එපමණ ගොඩ කරන්නටත් වඩා ඇති වන්නේ ය. ඒ එසේ මැ යි. තිලෝගුරු බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් ම "බෝධිසත්තානං අධිප්පායා නාම ඉජ්ඣන්ති-" "බෝසතුන්ගේ අදහස් නම් සිදු වේ" යි වදාළ බැවින් අභිමතාර්ථසාධක වූ චින්තාමාණික්‍යයක් බඳු වූ මාගේ බෝධිසත්ත්වයන් වහන්සේගේ තේජසින් ම පස් මිටක් වත් කැටක් වත් නුවර දිසාවට දමන්නා තබා සිතිනුත් සිතූ එක ද සත්ත්වයෙක් නැත්තේ ය. සියල්ලෝ ම අවුත් තමන් පළමු උන්නා වූ ස්ථානයෙහි ම හිඳ ගත්හ.

අරුත් පැහැදිලි කිරීම

අකුසු	-	හෙණ්ඩුව
ආක්‍රෝශ පරිභව	-	නින්දා අපහාස
අන්තස්සර	-	ඔත්තුකාර/ ඇතුළත හැසිරෙන/ චරපුරුෂ
ගන්ධ දාම	-	සුවඳ මල් මාලා
පුෂ්පදාමාවලම්බිත	-	මල් වැල් එල්ලන ලද
විතානොපලක්ෂිත	-	වියනකින් යුක්ත වූ
කොට-පිය පුතු කථාවක්	-	කිව යුතු කථාවක්
කුරුබිලියෙන්	-	කුඩා රහස් දොරින්
දසරුවට	-	උරහිසට
ඇකයෙහි	-	උකුළෙහි
සුව පෝතකයන්	-	ගිරා පැටවා
පියා සඟළ	-	පියාපත් යුවළ
ඉසුරුමතුන්	-	ධනවතුන්
උකටලී	-	අලස/ උදාසීනව
නතුවෝ ම ය	-	සතු වූහ
යමුගුරු බාලා	-	යකඩ පොලුවලින් ගසා
පසල් දනවුවැ නුවරට	-	පංචාල දේශයට අයත් නුවරට/පිටිසරට අයත් නුවරට
ක්ෂෝභ	-	කැලඹීමට පත් කොට
දළ පුඬු සේසත්	-	ඇත් දත් මිට සහිත සුදු කුඩ
ශෘංගි ලා	-	විෂ යොද
වේරම්බ වාතයෙන්	-	අහසෙහි යොදුනක් පමණ එපිට ඇතැයි සැලකෙන වාතයෙන්
හැළලී ගිය	-	කැලඹී ගිය
රන් පොරෝදු	-	රත්තරන් සැරසිලි

තෝමර	-	කුන්තායුධ
ප්‍රතිමණ්ඩිත	-	සමන්විත
කාහල	-	හොරණෑ
ධ්වජ පඞ්ක්ති	-	කොඩිපේළි
හියොවුරු	-	හී කොපු
ධනුර්ධරයන්	-	දුනුවායන්
උපලක්ෂිත	-	අලංකාර වූ
නිකෘෂ්ට	-	නින්දිත
විදුරසුන්	-	වජ්‍රාසන
අන්‍යතර	-	එක්තරා
අසි	-	කඩු
ශක්ති	-	හෙල්ල
කරවාල	-	කෙටි කඩු විශේෂයක්
හෙණ්ඩිවාල	-	අනිත ආයුධ
විගමනයෙන්	-	දුරුවීමෙන්
සින්නම්හර	-	හොරණෑව
තන්තිරි පට	-	වීණා විශේෂයක්
ගැටපහටු	-	දෙණ්ඩිම නම් බෙර
පනා බෙර	-	කළ බෙර
මූදු පරගානා	-	මුහුදු ඝෝෂා කරන්නාක් මෙන්
කනක	-	කරාබු
කටක	-	වළලු
රසනා	-	මෙවුල් දම/ හවඩිය
නූපුර	-	පයේ බඳින ආභරණ
තාඩංක	-	කනේ පලඳින ආභරණයකි
වළය	-	මුද්ද
අවුල් හර	-	පපුව මත පලඳින ආභරණ විශේෂයක්
උදර බන්ධන	-	උදරය (බඩ) වටා බඳින ආභරණ
ඉස්බක්	-	රියන් එකසිය හතළිහක දුර
ගැට තිමුල් හර	-	ශරීරාභරණ
පේරැස්	-	රජුගේ නම කෙටූ මුද්ද
එක්වැටි	-	එක් පටකින් යුත් මාල විශේෂයක්
පාදජාලා	-	පයෙහි දමන ලද දැල් ආභරණ
පාදනු	-	පාදයේ ආරක්ෂාවට දමන වැසුම්
එළුසන්	-	ප්‍රීතියෙන් නගන හඬ
ඔල්වරසන්	-	ජය ඝෝෂා
අසුරුසන්	-	මහපටැඟිල්ල හා මැදැඟිල්ල එකට ගැටීමෙන් ශබ්දයක් නිකුත් කිරීම
ආශීර්විෂයක්හු	-	විෂ සහිත සර්පයකු

දිගන්තරයෙහි	-	සෑම දිසාවෙහි
අසම්භීත ව	-	එඩිතර ව/ නොබිය ව
විජෘම්භනය	-	වැජඹෙන
සෛන්ධවයන්	-	අශ්වයන්
උපමා විෂයාතික්‍රාන්ත	-	උපමා කළ නොහැකි
අක්ෂෞහිණිය	-	අංග සම්පූර්ණ මහා යුධ සේනාව (ඇතුන් 21870, අශ්වයන් 65510, රථ 21870, පාබළ 109350)
ධවලඡත්‍ර	-	සුදු කොඩි
සුප්‍රතිෂ්ඨිත	-	ස්ථිර ව/ නොසැලෙන සේ පිහිටි
සමෘද්ධ	-	සඵල වූ
සමුජ්වලිත	-	බබළන

අභ්‍යාස

01. මහෞෂධ පණ්ඩිතයන්ගේ උපාය කෞශල්‍යය හේතුවෙන් වෛදේහ රාජ්‍යය ආරක්ෂා වූ ආකාරය පැහැදිලි කරන්න.

02. හාස්‍යයෙන් හා උපහාසයෙන් යුක්ත ව කේවට්ට බමුණාගේ චරිතය නිර්මාණය කර ඇති අන්දම පාඩම ඇසුරෙන් විමසන්න.

03. "උම්මග්ග ජාතක කථාවෙහි සාර්ථකත්වයට එක් හේතුවක් වී ඇත්තේ එහි යොදා ගත් භාෂා රීතියයි" නියමිත කොටස ඇසුරින් සාකච්ඡා කරන්න.

04. මහෞෂධ පණ්ඩිතයාගේත් කේවට්ට බමුණාගේත් චරිත තුළ ඇති සම විෂමතා දක්වන්න.

05. වචන විනාශකාරී ලෙස භාවිතයෙන් සමාජයකට විය හැකි හානි පාඩම ඇසුරෙන් විමසන්න.